# 4 වන දවස

## අබ්බා තාත්තා, අප මොන තත්ත්වයක සිටියත් අපව පිළිගන්න කෙනෙකි.

ශු. ලූක් 15:11-24 දක්වා කියවන්න.

නාස්තිකාර පුත්‍රයා ආපසු හැරී තම පියා වෙතට එනවිට දුරතියාම ඔහු දැක අනුකම්පාවෙන් ඇළලී දුව ගොස් දෑතින් ඔහුගේ ගෙල වැළඳ සිප ගත්තේ ය. ආපසු තාත්තා වෙතට පුතා ආවේ වැරහැලි ඇඳගෙන ය. පියාට එය ප්‍රශ්නයක් නොවී ය. ඉන්න තත්ත්වයෙන්ම ඔහු වැළඳ ගත්තේ ය. අපගේ ආදර අබ්බා තාත්තා ද මේ පියා වාගේ ය. අප මොන පාපිෂ්ඨ තත්ත්වයක සිටියත් හැරී එනවා නම් අපව ආදරයෙන් වැළඳ ගන්නට දෙවි පියාණෝ ලැහැස්තිව සිටින සේක. හැරී ඒම සඳහා අපව පොළඹවන්නේ ද මේ පියාණන් වහන්සේම ය. අපට සිටින්නේ මොන තරම් අපට ආදරය කරන පියාණන් වහන්සේ කෙනෙක් ද? ඔවුන් වහන්සේගේ ආදරයට සීමාවක් නැත, කොන්දේසි නැත. අප හද තුළ තිබෙන පිපාසය සංසිදෙන්නේ මේ ආදරය අත්දකින විට පමණ ය.

ගීතාවලිය 63:1 **"දෙවිඳුනි, මාගේ දෙවිඳුනි, දැඩි ආශාවෙන් මම ඔබ සොයන්නෙමි. මා හද ඉතා ගිජු ලෙස ඔබ කෙරෙහි පිපාසයෙන් පෙළෙන්නේ ය. වියළි බිම ජලයට පිපාස වන පරිදි මම ඉතා ආශාවෙන් ඔබ වෙත ඇදී යන්නෙමි."**

**දවස පුරා :-**

✵ මෙලොව මට ලැබෙන මොන ම ආදර සැලකිල්ලකටවත් මාගේ අභ්‍යන්තරික පිපාසය සංසිඳවිය නොහැක. අද දවස පුරා දෙවියන් වහන්සේගේ අසීමිත ආදරයට මම විවෘත වෙමි. 'දෙවිඳුනි ඔබ මට ආදරෙයි' කියා කීප විටක් කියන්න.

✵ පුබුදු ගීතාංජලී ගී අංක 158